# ලෙඩ්ඩු නෙවෙයි වගේ පෙනුනට ඔය වටේ ඉන්න හැම මිනිහෙක්ම ලෙඩෙක් තමයි ස්නේහා

ලෙඩා හිටියේ බිත්තිය පැත්තට මුහුණ දමාගෙනය. ඒ මදිවට හිසේ සිට පාදාන්තය තෙක් පොරවාගෙනය. හීන් ගෙරවිලි සද්දයක්ද ඇසුණි. තලත්තෑනි මනුස්යෙක් විය යුතුය.

ස්නේහා ශබ්ද නොනැගෙන ලෙස කාමරය පිළිවෙල කළාය. උපකරණ තබන කුඩා මේසය තල්ලුකරගෙන විත් ඇඳ අසලින් තැබුවාය. ඒ මත වතුර වීදුරුවක් පුරවා තැබුවාය. ලොකු මේසය මත වූ මල් බඳුනේ මල් අපිළිවෙලට විසිරිලාය. ස්නේහා ලෙඩාට පිටුපා සිටගෙන මල් බඳුන සකස් කළාය. එවැනි කලාත්මක වැඩවලට ඇය කවදත් දක්ෂය. සපත්තු මල් සහ ක්‍රෝටන් කොල වලින් පන්තියේ ගුරු මේසය හැඩ කළ කාලයේ පටන්ම ඒ සමත්කම ඇගේ දෑත් වල තිබුණි.

මේ කාමරය රෝහලේ ඇති හොඳම කාමරයකි. සුව පහ-සුකම් වලට අමතරව කාමරයේ පිහිටීම පවා විශේෂිත එකක් විය. කාමරෙයේ ජනේලය එක එල්ලේ පිහිටා තිබුණේ උද්‍යා-නයට මුහුණ ලා ය. මේ ජනේලයෙන් එපිට පෙනෙන උද්‍යානය දෙස වරුවක් වුද බලා සිටින්නට හැකිය. එහි පටු මං දිගේ අතිනත අල්ලාගෙන යන පෙම්වතුන් පමණක් නොව ඈත ළමා උද්‍යානයේ සෙල්ලම් කරන දරු පැටවුන් පවා මෙතැනට පෙනෙයි. ඒ දෙස බලා ඉන්නට ස්නේහා කැමතිය. එහෙත් ඈ ආපසු හැරුණේ කිසිවකු තමා දෙස බලා සිටින්නේ යයි ඉවෙන් මෙන් දැනුණ නිසාය.

බලා සිටින්නේ ඇඳේ නිදා සිටි ලෙඩාය. තළත්තෑනියකු වන්නට ඇතැයි සිතුණ රෝගියා තරුණයකු බව ඈ දුටුවාය. ඔහු සිනාසෙමින් බලා සිටියි. ඒ සිනාව සිත්ගන්නා සුළුය. ඔහුගේ දෑස් පවා සිනාසෙන්නේ යයි ඇයට සිතුණි.

"නර්ස් නෝනගෙ රස්සාව ලෙඩ්ඩු බලා ගන්න එකද නැත්නම් පාර දිහා බලා ඉන්න එකද?" ඔහු ඇසුවේය. ඒ හඬෙහි තරහක් තිබුණේ නැත.

"සොරි සර්.. මම.. හිතුවෙ... සර් නිදි.. කියලා.." ස්නේහා ගොත ගැසුවාය.

ස්නේහා ශබ්ද නොනැගෙන ලෙස කාමරය පිළිවෙල කළාය. උපකරණ තබන කුඩා මේසය තල්ලුකරගෙන විත් ඇඳ අසලින් තැබුවාය. ඒ මත වතුර වීදුරුවක් පුරවා තැබුවාය. ලොකු මේසය මත වූ මල් බඳුනේ මල් අපිළිවෙලට විසිරිලාය.

"අවදියෙන් ඉන්න ලෙඩ්ඩුන්ට පමණක් සාත්තු කළ යුතුයි කියලද ෆ්ලොරන්ස් නයිටින්ගේල් නෙ-ෝනා කියලා තියෙන්නෙ?" ඔහු අසන්නේ ඇය අම-ාරුවේ දමන්නට වගේය.

"අනේ සොරි සර්.. මම.. මල් එක හදන ගමන්.. නිකමට වගේ පාක් එක දිහා බැලුණා.. සර්ට මොනා හරි ඕනෙද? බොන්න දෙයක්?" ස්නේහා ගොත ගැසුවාය. පිට පුරා හීන් දාඩියක්ද ගලා යනු දැනෙයි. පපුවත් ගැහෙනවා ඇයටම දැනෙයි.

"බොන්න මොනා හරි තිබුණ නම් හොඳයි.. ඒත් හොස්පිට්ල් එකේ තියෙනවද මන්දා?"

"මොනාද..?"

"බොන ජාති.."

"තියෙනවා.. ඔරෙන්ජ් ජූස්.. ලෙමනේඩ්.. බාර්ලි.. තේ.. කෝපි.."

"ඒ මොනවද ළමයො.. ඒ පොඩි ළමයි බොන ජාතිනෙ.. අපි බොන්නෙ ඕව නෙවෙයි.."



"ලෙඩ වුණාම බොන්න දෙන්නෙ ඒව තමයි.."

"කවුද ලෙඩ වෙලා ඉන්නෙ..?"

මොන හතර බීරි කතා කියනවද මන්දා.. ස්නේහා සිතුවාය.

"ඇයි සර් ලෙඩ වෙලා නෙවෙයිද?"

"ලෙඩ වෙලා නෙවෙයි... ලෙඩක් දාගෙන.." ඒ හතර බීරි කතාව කීවේද අර ලස්සන සිනාව දාගෙනමය. කියන දෙයක් තේරෙන්නට නොකියන එකත් මහ වදයකි.

## "ස්නේහගෙ තේ රසයි..."

"මට තේරෙන්නෑ සර් මොනා කියනවද කියලා.. දැන් ඩොක්ටර් ආවම දැනගන්න පුලුවන්නෙ ලෙඩක් තියෙනවද නැද්ද කියල .."

"ඇයි ස්නේහට කියන්න බැරිද මට ලෙඩක් තියෙනවද නැද්ද කියලා.."

ස්නේහා තිගැස්සුණේ ඒ කතාවටම. එයා මගේ නම දන්නෙ කොහොමද? ඈ සිතුවාය.

"මොකද බය වෙලා වගේ.. ස්නේහා දන්නවද..? මට දිවැස් තියෙනවා.. ඕන කෙනෙක්ගෙ මූණ බලලා නම කියන්නත් පුලුවන්.." ලෙඩා නැගිට ඇඳ මත එරමිණියා ගොතාගෙන වාඩි වුණේය.

"විහිලු කරන්න එපා සර්.. කොහොමද මගේ නම දැන ගත්තෙ ..?"

"ඉවෙන්.. දිවැසින්.. ස්නෙහගෙ ගම නුවර පැත්තෙ නේද?"

"ඒ වතාවේ නම් ස්නේහා හොඳ හැටිම තිගැස්සුණාය. මූණත් රතුවුණෝය.

"ඔය හැටි කලබල වෙන්න එපා ස්නේහා.. අයියෝ මං වගේ මිනි-හෙක්.. මම තාම මාව අඳුන්නලා දුන්නෙත් නෑනෙ... මම අකලංක අමරසේකර.."

"මං දන්නවා.."

"ඒ කොහොමද..? ඔයාටත් දිවැස් තියෙනවද..?"

"දිවැස් මොකටද.. ඔය බෙඩ් හෙඩ් ටිකට් එකේ ලොකුවට ලියල තියෙන්නෙ.."

අකලංක යමක් කියන්නට ගියද දොස්තර මේනක සිරිවර්ධන ඒ වොලාවේම කාමරයට ඇතුල් වූ බැවින් එය වළකා ගත්තේය.

වෙනදාට මේනකගේ විසිට් එකට පිරිවර සෙ-"නාවක්ද එයි. උපකරණ උස්සාගත් දෙතුන් දෙනෙකි. සටහන් පොත් බෑග් උස්සා ගත් අයද එයි. ඒත් අද මේනක ඇවිත් ඉන්නේ තනිවමය. ඒ ආවේත් වෙනදා වගේ කලබලයකින් නොවේ. බොහොම සැහැල්ලුවෙන්ය. වෙනදාට කරෙන් නොගැළවෙන වෙද නලාවවත් අද නැත.

අකලංක ගේ ඇඳේ කෙළවරකින් වාඩි වූ මේනක රහසින් මෙන් යමක් අසයි. දෙන්නා යාලුවන් වන්නට ඇතැයි ස්නේහාට සිතුණි. ඒ කතාවට ඇහුම් කන් දීම නුසුදුසු යයි හැඟුණ බැවින් ස්නේහා ජනේලය ළඟට ගොස් පිටත බලා ගත්තාය.

"ස්නේහා.. හොඳ දරුවා වගේ අපට තේ දෙකක් හදල දෙන්නකො.." දොස්තර මේනක කීවේය.

ස්නේහා කාමරයේ කෙළවරක වූ පැන්ට්‍රිය වෙත ගොස් වතුර හීටරය ඔන් කළාය. තේ දෙක විනාඩි දෙකෙන් හදන්නට පුලුවන් නමුත් ඈ ඒ සඳහා විනාඩි පහක් වත් වැය කළාය. ඔවුන්ට අවශ්‍යව ඇත්තේ තමා ඔවුන්ගේ කතාව නෑසෙන මානයකින් තැබීම බව ඇයට වැටහුණ නිසාය. එහෙම වෙලාවට මගඇර සිටින එක ඇයට අමුතුවෙන් කියා දෙන්නට අවශ්‍ය නැත.

සුදු කෝප්ප දෙකකට තේ සාදාගෙන යන-කොටත් දෙන්නා රහස් කතාවේය.

"ස්නේහගෙ තේ රසයි..." මේනක කියන්නේ කතාව වෙනතකට හරවන්නට වගේය.

අකලංක පිළිතුරක් නොදුන්නේය. ඔහු සිටියේ කල්පනා කරමින්ය. අතට ගත් තේ කෝප්පය දිහා බැලුවේවත් නැත.

මතු සම්බන්ධයි